සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

# නාට්‍ය හා රංග කලාව

6 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 පහත සඳහන් කතා අතරින් ජන කතාවක් වන්නේ,

(i) පුංචි අපට දූන් තේරෙයි (ii) නරි බෑණා

(iii) හීල් බත් දංකුඩ (iv) වළහා හා මාෂා

02 රඟපා පෙන්විය හැකි ස්වභාවික සිද්ධියක් වන්නේ,

(i) හිරු නැගීම (ii) රංග අභ්‍යාස (iii) ගල් කැඩීම (iv) නිවාස තැනීම

03 නාට්‍යයක් නරඹන පුද්ගලයා හඳුන්වන්නේ,

(i) ප්‍රේක්ෂකයා (ii) නළුවා (iii) ශ්‍රාවකයා (iv) පාඨකයා

04 සමාරෝපය යනු

(i) චරිත අනුකරණය කිරීමයි. (ii) චරිතයකට පිවිසීමයි.

(iii) ක්ෂණික නිරූපණයයි. (iv) අභිරූපණයයි.

05 යම්කිසි චරිතයක් ඒ අයුරින්ම නිරූපණය කර දැක්වීම හඳුන්වනු ලබන්නේ,

(i) සමාරෝපය (ii) එසැණ නිරූපණය

(iii) අනුකරණය (iv) රූපණය

- <u>නොගැලපෙන</u> පිළිතුර යටින් ඉරක් අඳින්න.

06 විහාර මහා දේවී කතාව

(i) දේශීය කතාවකි. (ii) විදේශීය උපමා කතාවකි.

(iii) ඓතිහාසික කතාවකි. (iv) වීර කතාවකි.

07 ''මල්ලියෙ ඔහොම නොකරන් අපෙ අම්මාට'' යන ජනකතාවෙන් ලබාගත හැකි ආදර්ශයක් වන්නේ,

(i) දෙමාපියන්ට සැළකීම. (ii) කළගුණ සැලකීම.

(iii) යහපත් ආහාර පුරුදු පවත්වා ගැනීම. (iv) පවුලේ සමගිය රැක ගැනීම.

- හිස්තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(කුමරිය / නෙළුම් කුමාරි / සිංහබාහු / නාට්‍ය)

08 ළමා නාට්‍යයක් වන්නේ ...................................................... ය.

09 හීල්බත් දංකුඩ ජනකතාවේ ................................................ එහි එන එක් චරිතයකි.

10 ''ආලෙ බැන්ද මාගෙ රම්‍යවන්'' යනු ............................ .... ගීතයකි.

- හරි නම් (✓) ලකුණ ද , වැරදි නම් (✗) ලකුණ ද වරහන් තුළ යොදන්න.

11 නාට්‍යක් රඟදක්වන ස්ථානය රංග භූමිය නම් වේ. ( )

12 සත්වයින්ගේ යහපත් චර්යාවන්, මිනිස් ජීවිත යහපත් කර ගැනීම සඳහා ඉවහල් නොවේ. ( )

13 චරිතයක ඇති විවිධ පැතිකඩ භූමිකා නම් වේ. ( )

14 නාට්‍ය පිටපතක රංග විධාන දක්නට ලැබේ. ( )

15 කතන්දරයක් ඇසුරින් නාට්‍යයක් නිර්මාණය කළ නොහැක. ( )

- ගැලපෙන පිළිතුර තෝරා යා කරන්න.

| | A | | B |
|---|---|---|---|
| 16 | මුඛ පරම්පරාවෙන් පැවත එන | • | අත්දැකීම් |
| 17 | පුංචි අපට දූන් තේරෙයි | • | කපුටා සහ කේජු කැල්ල |
| 18 | ඇසීම හා නැරඹීම | • | සෝමලතා සුභසිංහ |
| 19 | මුහුණින් හැඟීම් ප්‍රකාශය | • | වේදිකා නාට්‍ය |
| 20 | ජීවිතයේ එදිනෙදා ලබන්නකි | • | සාත්වික අභිනය |

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

01 (i) ඔබ දන්නා ජන කතා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) නම් කළ ජන කතා දෙකේ චරිත තුනක් තෝරාගෙන එම චරිතවල චරිත ලක්ෂණ එක බැගින් ලියන්න. (ලකුණු 03)

(iii) පහත මාතෘකා වලින් එකකට චිත්‍ර කතාවක් අඳින්න.

- ඓතිහාසික කතාවක්
- ජන කතාවක්
- සුරංගනා කතාවක් (ලකුණු 05)

02 (i) පරිසරයේ දක්නට ලැබෙන ස්වභාවික සිදුවීම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) එම සිදුවීමක් ඔබ පන්ති කාමරයේ දී අනුකරණය කළ අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) ඔබ කැමති පරිසරයේ සිදුවන ස්වභාවික සිදුවීමක් පිළිබඳව කවි දෙකක් නිර්මාණය කරන්න. (ලකුණු 05)

03 පහත නාමාවලිය උපයෝගී කරගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(දෙවියෝ / ගමරාළ / කිඳුරිය / හිඟන්නා / රෙදි නැන්දා / බල්ලා / යෝධයා / සමනලයා / ඉර / මල / ගම හාමිනේ / යක්ෂයා / ගස / අලියා / ගුරුතුමා / ඇමති / පූසා / හොල්මන / ගඟ / වෙළෙන්දා / වැද්දා / ගල් / කොටියා / සුරංගනාවිය / පිස්සා)

(i) ඉහත නාමාවලියෙන් ''ගමරාළ දිව්‍ය ලෝකේ ගියා වගේ'' යන ජනකතාවට අයත් චරිත 4 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) පහත වගුවට ඇතුලත් කළ නොහැකි චරිත මොනවා ද? (ලකුණු 03)

(iii) ඉහත නාමාවලියෙන් ගැලපෙන චරිත පමණක් තෝරා පහත වගුව සම්පූර්ණ කරන්න. (ලකුණු 05)

| මිනිස් චරිත | සත්ත්ව චරිත | මනඃකල්පිත චරිත |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

04 (i) පහත මාතෘකාවලින් එකක් තෝරාගෙන එයට ඔබ කැමති චරිත ද එක් කරමින් කුඩා දෙබසක් නිර්මාණය කරන්න.

- සමනලයා හා මල
- තණකොළ පෙත්තා හා කුඹීච්චී
- සුරංගනාවිය හා අන්ධ දරුවෙක් (ලකුණු 05)

(ii) ඔබ නිර්මාණය කළ දෙබසෙහි ඇති චරිතවලට සුදුසු ඇඳුම් කට්ටල දෙකක් අඳින්න. (ලකුණු 05)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) iii (02) i (03) i (04) ii (05) ii (06) ii (07) iii
(08) නෙළුම් කුමාරි (09) කුමරිය (10) නාට්‍ය (11) ✓ (12) ✗ (13) ✓
(14) ✓ (15) ✗

## II කොටස

01 (i) කපුටා සහ කේජු කැල්ල, ගමරාළ දිව්‍යලෝකේ ගියා වගේ, හාවායි ඉබ්බයි රේස් එක, පුහුල් හොරා කරෙන් දූනේ, අන්දරේගේ කතා වැනි... (ල. 02)

(ii) දරුවා තෝරාගත් කතාවේ චරිතවල ලක්ෂණ ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 03)

(iii) කතාව කොටස් කීපයකට බෙදා අංක පිළිවෙලට චිත්‍ර හා දෙබස් ලියා ඇත්නම් අදාළ ලකුණු පිරිනමන්න. (ල. 05)

02 (i) හිරු නැගීම / මල් පිපීම / ඇළ දොළ ගැලීම / වැස්ස / සුළඟ වැනි..... (ල. 02)

(ii) උදාහරණ

හිරු නැග ඒම ගතහොත්, හිරු කන්ද උඩින් පායන අයුරු පෙන්වූ ආකාරයත්, මල් පොහොට්ටු පිපුණ ආකාරයත්, කුරුල්ලන් සමනලයන් එහෙ මෙහෙ සැරි සැරූ ආකාරයත්, වැඩට, පාසලට යන ළමුන් පෙන්වූ ආකාරයත් නිරූපණය කළ අයුරු විස්තර කර ඇත්නම් අදාළ ලකුණු පිරිනැමිය හැකිය. එසේ අනෙකුත් මාතෘකාවලට ද ලකුණු ලබාදෙන්න. (ල. 03)

(iii) සදැස් හෝ නිසදැස් ක්‍රම දෙකෙන් ඕනෑම ක්‍රමයකට ලකුණු ලබාදෙන්න. (ල. 05)

03 (i) ගමරාළ, ගමහාමිනේ, අලියා, රෙදි නැන්දා (ල. 02)

(ii) ඉර, මල, ගස, ගඟ, ගල් (ල. 03)

(iii)

| මිනිස් චරිත | සත්ත්ව චරිත | මනඃකල්පිත චරිත |
|---|---|---|
| ගමරාළ | බල්ලා | දෙවියෝ |
| හිගන්නා | සමනලයා | කිඳුරිය |
| රෙදි නැන්දා | අලියා | යක්ෂයා |
| යෝධයා | පූසා | හොල්මන |
| ගම හාමිනේ | කොටියා | සුරංගනාවිය |
| ගුරුතුමා | | |
| ඇමති | | |
| වෙළෙන්දා | | |
| වැද්දා | | |
| පිස්සා | | |

(ල. 05)

04 (i) දී ඇති චරිත දෙකට අමතරව තවත් එක් චරිතයක් හෝ ඇතුළත් කොට දෙබස නිර්මාණය කර ඇත්නම් අදාළ ලකුණු පිරිනමන්න. (ල. 05)

(ii) සුදුසු ඇඳුම් කට්ටල දෙක පමණක් හෝ චරිතය සමගින් ඇඳුම් කට්ටල දෙක හෝ ඇත්නම් අදාළ ලකුණු ලබාදෙන්න. (ල. 05)